# *110 වසරක ප්‍රෞඩ ඉතිහාසය සපුරන කොළඹ වෛද්‍ය පර්යේෂණ ආයතනය නව දැක්මකින් අනාගතය වෙත*

බ්‍රිතාන්‍ය යටත් විජිත යුගය විසින් මෙරටට දායාද කරවන ලද මහගු සම්පත් අතර මුල් තැනක් ගනු ලබන්නේ විශිෂ්ඨ පාර්ලිමේන්තු පාලන ක්‍රමයත්, අධ්‍යාපන පද්ධතියත්, සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි ස්ථාපිත කරවන ලද සෞඛ්‍ය සේවාවත් වේ. සමස්ථ ආසියාවේම වෛද්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ පුරෝගාමී ආයතනයක් ලෙස 1870 දී කොළඹ වෛද්‍ය විද්‍යාලය පිහිටුවා ඉන් අනතුරුව බටහිර වෛද්‍ය කර්මයට අදාල විවිධ ආයතනයන් ක්‍රමයෙන් මෙරට තුල ඇති කරවීමේ වැඩ පිළිවෙලක් එකල ක්‍රියාත්මක විය.

නව ප්‍රභූ පන්තියේ (New Aristocracy) ප්‍රමුඛ දානපතීන් වූ සැම්සන් විජේගුණරත්න, ඩී.ආබෲ ද සොයිසා, චාල්ස් සොයිසා ආදීන් කොළඹ වෛද්‍ය විද්‍යාලය, මහාරෝග්‍ය ශාලාව මෙන්ම සොයිසා මාතෘ රෝහල වැනි ආයතන පිහිටුවීමට ඔවුන්ගේ ඉඩකඩම්, මන්දිර මෙන්ම ධනයද දස දහස් ගණනින් පරිත්‍යාග කළහ.

අති දීර්ඝ කාලයක් බ්‍රිතාන්‍ය කිරීටය දැරූ වික්ටෝරියා අධිරාජිණියගේ රාජ්‍ය සමයෙහි දියමන්ති ජුබිලිය එළඹුණු 1899 වසරේදී ඒ නිමිති කොට ගෙන වාසළ මුදලි ජේ.ඩබ්.සී ද සොයිසා මැතිතුමන් ගේ ධන පරිත්‍යාගයෙන් වෛද්‍ය පර්යේෂණ සඳහා වූ ආයතනයක් වෛද්‍ය විද්‍යාලයට මදක් බැහැරින් බේස්ලයින් මාර්ගය බොරැල්ල මංසංදියට ප්‍රවිශ්ඨ වන කඳු ගැටය මත ඉදි කෙරිණි. එවකට ලංකාණ්ඩුවේ ප්‍රධානියා වූ ආණ්ඩුකාර සිරිමත් ජෝසප් වෙස්ට් රිජ්වේ අතින් 1900 ජනවාරි මස 31 දින "ද සොයිසා බැක්ටීරියාවේදී ආයතනය" (The De Soysa Bacteriological Institute) ලෙස මෙය විවෘත විය. වෛද්‍ය එච්.එම්.ප්‍රනාන්දු මහතා මෙම ආයතනයෙහි ප්‍රධානියා ලෙස පත්වූ අතර, ඒ වන විට අතලොස්සක් වූ ලාංකේය වෛද්‍යවරුන් අතරින් මහත් කීර්තියට පත්වූ ඒ මහතා පසුව නයිට් නාමයකින්ද පිදුම් ලැබ සර් මාකස් ප්‍රනාන්දු නමින් හැඳින්වෙනඅතර, ඔහු සිහි ගන්වන වීදියක්ද පසුව නම් කෙරිණි.

ද සොයිසා බැක්ටීරියාවේදී ආයතනයේ ප්‍රථම පූර්ණ අධ්‍යක්ෂවරයා ලෙස 1903 වසරේදී පත්වූයේ ඒ වන විටදිලොව විද්වතුන් අතර නමක් දරා සිටි ඉතාලියානු ජාතික වෛද්‍ය ඇල්ඩෝ කැස්ලානි (Aldo Castellani) ය. නිද්‍රා රෝගය Sleeping Sickness පිළිබඳව උගන්ඩාවෙහි සිට නොයෙකුත් පර්යේෂණ පැවැත්වූ වෛද්‍ය කැසලානි එම රෝගීන් ගේ මස්තිෂ්ක සුෂුම්නා තරළයන්හි සිටි පරපෝෂිත ජීවියා සොයා ගැනීමෙන් වෛද්‍ය ක්ෂේත්‍රය තුල අනභිබවනීය කීර්තියකට පත්ව සිටි හෙයින් ඔහු අධ්‍යක්ෂක ධූරයට පත්වූ දින සිට කොළඹ වෛද්‍ය පර්යේෂණ ආයතනයද ලොව පුරා විද්වතුන්ගේ අවධානය දිනා ගැනීමට සමත් විය.

දිගින් දිගටම බැක්ටීරියා, දිලීර හා පරපෝෂී ජීවීන් පිළිබඳව ශ්‍රී ලංකාව තුල පර්යේෂණ ගණනාවක් සිදු කරමින්එම අධ්‍යයන ප්‍රථිඵල අන්තර් ජාතික ප්‍රකාශන Journal හි පලකල වෛද්‍ය කැසලානි ඔහු සොයාගත් ඇතැම් ජීවීන්ට දේශීය නම් යෙදීම හේතුවෙන් කොළඹ බැක්ටීරියාව Bacterium Columbensis කෑගලු විබ්‍රියෝ Vibrio Kegallensis ආදිය නාමකරණ ඉතිහාසයට එකතු විය. ඒ වන විට ලොව පුරා වසංගතයක්ව තිබූ වසූරිය පිළිබඳ එන්නත් අංශයක්ද මෙහි පිහිටුවා ලංකාවට පමණක් නොව සමස්ථ ඝර්ම කලාපීය දේශයන් වෙනුවෙන් ශ්‍රේෂ්ඨ මෙහෙවරක් කරමින් සිටි වෛද්‍ය කැස්ලානි හට 1915 එළඹි 1 ලෝක යුද්ධය හේතුවෙන් ඔහු මහත් සේ ප්‍රිය කල මේ දිවයින අත හැර ආපසු ඉතාලිය බලා යාමට සිදු වූයේ මහත් අභාග්‍ය සම්පන්න ලෙසයි. වෛද්‍ය පර්යේෂණ ආයතනයෙහි අනාගතය තිර ලෙස තහවුරු කිරීම වෙනුවෙන් ප්‍රමුඛ මෙහෙවරක් ඉටුකළ ඔහුගේ නමින් අද දවසේ එහි ප්‍රධාන ශ්‍රවණාගාරය "අල්ඩෝ කැසලානි" නමින් නම් කොට තිබේ.

ආසන්න සමයෙහිම සිදුවූ තවත් එක් අනුවේදනීය සිදුවීමක් සමග සිරිලක වෛද්‍ය පර්යේෂණ ඉතිහාසය බැඳී පවතී. ඒ එවකට විසූ ප්‍රමුඛතම ධනකුවේරයා වූ සොයිසා මැතිතුමාව සිය නිවස තුල සිටියදීම සුනඛයකු විසින් සපාකන ලද හේතුවෙන් ඔහුට ජලභීතිකා රෝගය වැළඳුණු බවටත්, ලංකාවේ ඔහුට ප්‍රතිකාර කල නොහැකි වූ තැන, ආසන්නම ආයතනයවූ ඉන්දියාවේ “නිල්ගිරි” හි තිබූ පාස්චර් ආයතනය Pasteur Institute වෙත ගෙන යාමට සිදු වූ බවත්‍ය.මෙම සිදුවීමෙන් සොයිසා මහතා ඛේදනීය ලෙස මිය යාමෙන් පසු සියලු ජනයා ගේ සේවය උදෙසා සොයිසා පවුලේ ධන පරිත්‍යාගයෙන් වර්තමාන රිජ්වේ ආර්යා රෝහල පිහිටි භූමියෙහි පාස්චර් ආයතනයෙහි ශාඛාවක්ද ස්ථාපිත කෙරිණ.

දශක ගණනාවක් පුරා ප්‍රමුඛ සේවාවන් ඉටු කරනු ලැබූ මෙම ආයතනයන් යුගල 1936 දී ඒකාබද්ධ කෙරුණු අතර, වෛද්‍ය එල්.බී.ඊ.සෙනෙවිරත්න මහතා ගෙන් අනතුරුව 1946 මාර්තු 01 දින සිට “වෛද්‍ය පර්යේෂණ ආයතනය” නමින් වෛද්‍ය ඒ. නිමලසූරිය මහතා අධ්‍යක්ෂ ධූරයට පත් කෙරිණි.මේ අයුරින් බැක්ටීරියා, වෛරස්, දිලීර, පරපෝෂී ජීවීන් ඇතුලු සියලු ක්ෂුද්‍ර ජීව විද්‍යාවන්ද, කීට විද්‍යාව, පටක විද්‍යාව, ජීව රසායන විද්‍යාව, ඖෂධවේදය සහ විශේෂයෙන් ජලභීතිකාව රෝගය පිළිබඳ ශ්‍රී ලංකාව තුල ප්‍රමුඛ හා විශේෂ පර්යේෂණයන් සිදු කරන ආයතනය ලෙස වෛද්‍ය පර්යේෂණ ආයතනය දශක ගණනාවක් තිස්සේ ස්ථාවර වූ අතර, රෝගී ප්‍රතිකාර සඳහා අත්‍යාවශ්‍ය වූ සුවිශේෂ රෝග විනිශ්චය පර්යේෂණ සිදු කිරීමෙන් ලක්ෂ සංඛ්‍යාත රෝගීන් ගේ සෙත සුව සලසන ප්‍රමුඛ ආයතනයක් ලෙස සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව තුලද සෞඛ්‍ය අමාත්‍යාංශය තුලද කීර්තිමත් තලයකට පත්විය.

1938 තරම් දුර ඈත අතීතයක සිටම පිහිටවූ පෝෂණ අංශය ලක්වැසි ජනයාගේ පෝෂණ තත්වය පිළිබඳව නිබඳ නිරන්තර පර්යේෂණයන් ගේ නිරත වන අතර, මව්වරුන්ගේ සහ ළදරුවන් ගේ පෝෂණය නංවනු පිණිස හඳුන්වා දුන් ත්‍රිපෝෂ සහමුලින්ම වෛද්‍ය පර්යේෂණ ආයතනයේ සොයා ගැනීමකි.

විසිවන සියවසෙහි මුල් දශක ගණනාව තුල දිවයිනෙහි ස්ථාපිතව තිබූ මැලේරියාව, ක්ෂය රෝගය, ලාදුරු, පෝලියෝ, වසූරිය, බරවා ආදිය මෙන්ම විවිධාකාර වූ පරපෝෂී පණු රෝගයන් ගෙන්ද මෙහි ජනතාව මුදවා ගැනීමෙහි වූ දැවැන්ත අරගලයෙහි එක් “නිහඬ”එසේ වුවද අනභිබවනීය මහඟු කාර්ය භාරයක් වෛද්‍ය පර්යේෂණ ආයතනය විසින් ඉටු කර ඇත.වෛද්‍ය ඩොයන් සෙනෙවිරත්න, වෛද්‍ය ඞී.බී.ගුණසේකර, වෛද්‍ය කේ.මහාදේවා, වෛද්‍ය ග්ලැඩිස් ජයවර්ධන, වෛද්‍ය නිත්‍යානන්ද, වෛද්‍ය බී.ඒ.වී.පෙරේරා, වෛද්‍ය බාලසුනේත්‍රම් ආදීන් ගේ අධ්‍යක්ෂකත්වය යටතේ මේ විශිෂ්ඨ සේවාවන් ඉටු කිරීමට ප්‍රමුඛ පෙළේ විශේෂඥ වෛද්‍යවරුන්, පර්යේෂණ නිලධාරීන්, මෙන්ම රසායනාගාර තාක්ෂණවේදීන් ඇතුලු සියලු මට්ටමෙහි නිලධාරීන් දායක විය. 1959 වසරෙහි මෙහි පිහිටවන ලද වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදී පාසල (MLT School) සමස්ථ දිවයිනට අවශ්‍යවන රසායනාගාර තාක්ෂණවේදීන් බිහි කරනු ලබයි.

මෙසේ ශතයකට ආසන්න කාලයක් ප්‍රමුඛ සේවාවක නියැලුණ ද, ලොව වෙනස්වන රෝගී තත්වයන් සහ දියුණු වන තාක්ෂණ ක්‍රමෝපායන් සමග එකිනෙක ගැටෙමින් නැගී සිටීමේ ප්‍රමුඛ අවශ්‍යතාවයක් වෛද්‍ය පර්යේෂණ ආයතනයට ඇති විය.මේ දැවැන්ත ඉදිරි පිම්ම සඳහා ප්‍රමුඛත්වය ගනු ලැබුවේ 1985, වෛද්‍ය පර්යේෂණ ආයතනයෙහි අධ්‍යක්ෂ ධූරයට පත්වූ වෛරස් විද්‍යා විශේෂඥ වෛද්‍ය තිස්ස විතාරණ මැතිතුමාය.

එතුමාගේ මූලිකත්වයෙන් එළැඹෙන නව සහස්‍රකය සඳහා උචිතවන පරිදි නව තාක්ෂණයෙන් සපිරුණු රසායනාගාර සංකීර්ණයක් සඳහා පිඹුරුපත් සැකසුණු අතර, එම අනවරත අප්‍රතිහත උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස ජපාන රජයේද, ජපන් රටවැසියාගේ ධන පරිත්‍යාගයෙන් ජපාන අන්තර් ජාතික සහයෝගිතා ආයතනයේ අනුග්‍රහයෙන් රුපියල් මිලියන 700 ක වියදමෙන් එය ඉදි කෙරුණි. 1990-04-10 දින එවකට ජනාධිපති වූ අතිගරු රණසිංහ ප්‍රේමදාස ශ්‍රීමතාණන් ගේ අතින් විවෘත වූ තෙමහල් නව රසායනාගාර සංකීර්ණය සමස්ථ දකුණු ආසියාවෙහිම නවීනතම උපකරණ ආදියෙන් සමන්විත ප්‍රමුඛ ආයතනයක් බවට පත්වූ අතර, එහි සේවය සඳහා අවශ්‍ය වූ පුහුණුවීම් වෛද්‍ය පර්යේෂණ සහ රසායනාගාර කාර්ය මණ්ඩලය වෙත ජපානයෙන්ම ලබා දීම සිදු කෙරිණි.

මෙසේ වෛද්‍ය පර්යේෂණ ආයතනය දැවැන්ත සංවර්ධනයකට ලක් කිරීමෙහි ප්‍රමුඛ පුරෝගාමියා වූ වෛද්‍ය තිස්ස විතාරණයන් ඉන් අනතුරුව මහාචාර්ය ධූරයකින් පුද ලැබ අනතුරුව කැබිනට් අමාත්‍ය ධූරයක්ද ලැබ වර්තමානයේ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ධූරයකට පත්ව සිටී. වෛද්‍ය පර්යේෂණ ආයතන ඉතිහාසයෙහි හා මහාචාර්ය තිස්ස විතාරණ නාමය සදා නොසැලෙන සලකුණක් බවට පත්ව ඇත.

එතුමාණන් ගෙන් අනතුරුව එළැඹි සමයෙහි වෛද්‍ය පර්යේෂණ ආයතනය ඇතැම් අර්බුදයන් හමුවේ වුවද නිරන්තරයෙන් සිය කාර්ය භාරය ඉටු කරමින් නව සහස්‍රකයකට පිය නැගූ අතර ක්ෂේත්‍රයන් ගණනාවක් තුල පර්යේෂණ සිදු කරමින් වර්තමානයට එළැඹ සිටී.

ගෙවුණු වසර කීපය තුල එළැඹුණු ඩෙංගු වැනි වසංගත රෝගයන් හිදීද රෝග නිශ්චය සේවාවන් හි ප්‍රමුඛව දායක වූ අතර ඩෙංගු මර්දනය සඳහා වූ දේශීය බැක්ටීරියාව සොයා ගැනීමෙහිදී මෙහි විද්‍යාඥයන් අතින් පුරෝගාමී කාර්යක් ඉටු විය.

විශේෂයෙන් H1N1ඉන්ෆ්ලුවන්සා වසංගතය මර්දනය කිරීම පිණිස අවශ්‍ය රෝග පරීක්ෂණ මෙන්ම රෝග විමර්ශනයද සිදු කරන ලබන දිවයිනෙහි එකම ආයතනය වන්නේද කොළඹ වෛද්‍ය පර්යේෂණ ආයතනයයි. රටෙහි පවතින සියලු රසායනාගාරයන්හි ප්‍රමිතිය පවත්වාගෙන යනු ලබන තත්ව පාලන වැඩසටහන නියාමණය කරනු ලබන්නේ මෙම ආයතනය විසිනි.

විශේෂඥ වෛද්‍යවරු 15 දෙනෙක්ද, පර්යේෂණ නිලධාරීන් 17 දෙනෙක්ද, රසායනාගාර තාක්ෂණවේදීන් 80 දෙනෙක්ද, 200 ට අධික අනෙකුත් නිලධාරීන් ගෙන්ද සමන්විත වෛද්‍ය පර්යේෂණ ආයතනය, සෞඛ්‍ය අමාත්‍යාංශ්‍යය විසින් වසරක් තුල රුපියල් මිලියන ගණනාවක් වැය කර පවත්වා ගෙන යනු ලබන ප්‍රමුඛ ආයතනයක් වෙයි.ශ්‍රී ලංකාවේ විශිෂ්ඨ වූ සෞඛ්‍ය සේවාව පවත්වා ගෙන යාම පිණිස සුවිශේෂ වූ නිහඬ මෙහෙවරක යෙදෙන කොළඹ වෛද්‍ය පර්යේෂණ ආයතනය විශේෂඥ වෛද්‍යවරුන් මෙන්ම අනෙකුත් අදාල ක්ෂේත්‍රයන්හි විද්‍යාර්ථීන් පුහුණු කිරීම පිණිසද සෑම වසරකම ප්‍රමුඛ දායකත්වයක් දෙනු ලබයි.

නව සහස්‍රකය තුල ඉදිරියේ එළැඹෙන වෛද්‍ය ක්ෂේත්‍රයන්හි විවිධාකාර වූ අභියෝගයනට මුහුණ දීම පිණිස අදාළ පර්යේෂණයන්හි නියැලෙමින් විවිධ අන්තර් ජාතික ආයතනය සහ විශ්ව විද්‍යාලයන් සමග කටයුතු කරන වෛද්‍ය පර්යේෂණ ආයතනය නව ඉදිරි දැක්මක් සහිතව අනාගතයට පිය නගයි.

ගතවූ වසර 110 ක ඉතිහාසය ඒ සඳහා අවශ්‍ය වූ ස්ථාවර පදනමක් ස්ථාපිත කර ඇති හෙයින් නව අධිෂ්ඨානයකින් හා ජවයකින් යුතුව අද දවසේ වෛද්‍ය පර්යේෂණ ආයතනයෙහි සියලු දෙනා එක්සත්ව නැගී සිටී.



**විශේෂඥ වෛද්‍ය අනිල් සමරනායක,**
**අධ්‍යක්‍ෂක,**
වෛද්‍ය පර්යේෂණ ආයතනය,
කොළඹ.

www.mri.gov.lk